# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1543/39 - 2008 අප්‍රේල් 04 වැනි සිකුරාදා - 2008.04.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

### බස්නාහිර පළාතේ 2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

**98 (3) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ 2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 98(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන, රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය, පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය වන මම, පහත සඳහන් නියෝග 2008 අප්‍රේල් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කරමි.

*නියෝග*

මෙම නියෝග බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 98(3) (i,ii,iii,iv වගන්ති) සඳහා වූ නියෝග - (තෑගි තරග මත බදු පැනවීම) යනුවෙන් හඳුන්වනු ලැබේ.

I. බස්නාහිර පළාත තුළ පවත්වනු ලබන සෑම තෑගි තරගයකදීම පිරිනමනු ලබන ත්‍යාගවල මුළු වටිනාකම මත මෙහි පහත සඳහන් ආකාරයෙන් ගණනය කරනු ලබන අනුප්‍රමාණ බද්දක් අයකරනු ලැබේ:

| *ත්‍යාගවල මුළු වටිනාකම* | *බදු අනුප්‍රමාණය* |
|---|---|
| * රුපියල් ලක්ෂයට අඩුනම් | බදු නිදහස් |
| * රුපියල් මිලියන විසිපහක් (මි. 25) හෝ අඩු | 3% |
| * රුපියල් මිලියන විසිපහකට (මි. 25) වැඩි | 5% |

II. (අ) බලපත්‍රය උපලේඛනයේ දක්වා ඇති (ආ) ආකෘතියට අනුව විය යුතුය.

(ආ) බලපත්‍රය සඳහා වූ ඉල්ලුම්පත්‍රය උපලේඛනයේ දක්වා ඇති (අ) ආකෘතියට අනුව විය යුතු අතර රුපියල් දහසක (රු. 1,000) මුදල්වලින් ගෙවිය යුතු ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතුය.

(ඇ) පහත සඳහන් අනිකුත් ලේඛන ද ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වන්නේය : එනම්

(1) ඉල්ලුම්කරුගේ ලියාපදිංචි සහතිකය (ඉල්ලුම්කරු ආයතනයක් හෝ සංවිධානයක් නම්) සහ එකී සහතිකයේ සහතික පිටපතක් ;

(2) තෑගි තරගයට අදාළ වන්නාවූ අවස්ථාවෝචිත පරිදි රීති හෝ කොන්දේසි ඇතුළත්, අනුමත කරන ලද ලේඛන සහ ඒවායේ සහතික පිටපත් ද සමග එකී තෑගි තරගයේදී පිරිනමනු ලබන ත්‍යාග පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි විස්තරයක් ;

(3) බලපත්‍ර ගාස්තුව ගෙවූ බව සනාථ කිරීම සඳහා රිසිට්පතක් හෝ එවැනි යම් වෙනත් ලේඛනයක්.

III. තෑගි තරගය ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කරන ස්ථානය හෝ පරිශ්‍රය නිශ්චිත ව ප්‍රසිද්ධ කළ යුතුය.

IV. මෙම ප්‍රඥප්තියේ 98 වැනි වගන්තියේ සඳහන් වාර්තාව උපලේඛනයේ (ඇ) ආකෘතිය ප්‍රකාරව පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

මේ නියෝගවල "මුදල් ප්‍රඥප්තිය" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ 2006 අංක 2 දරන ප්‍රඥප්තියෙන් සංශෝධනය වූ එකී සභාවේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය අදහස් වේ.

පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන,
රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

ප්‍රධාන අමාත්‍ය කාර්යාලය, (බ.ප.)
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07.
2008 අප්‍රේල් මස 02 වැනි දින.

*උපලේඛනය*

| |
|---|
| ආකෘතිය (අ) බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය |
| ආකෘතිය (ආ) බලපත්‍රය |
| ආකෘතිය (ඇ) වාර්තාව |

*(අ) ආකෘතිය*

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)

බස්නාහිර පළාත තුළ තෑගි තරගයක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා අයදුම්පත්‍රය

1. තෑගි තරගය පවත්වනු ලබන තැනැත්තාගේ නම : ..............................
2. තෑගි තරගය පවත්වනු ලබන ස්ථානයේ ලිපිනය : ..............................
3. තෑගි තරගයේ නම : ..............................
4. තෑගි තරගය ප්‍රසිද්ධ කිරීම ආරම්භ කරන දිනය : ..............................
5. තෑගි තරගය සංවිධානය භාර තැනැත්තාගේ නම : ..............................
6. තෑගි තරගය පවත්වන දිනය : ..............................
7. තෑගි තරගයේ තෑගිවල සම්පූර්ණ වටිනාකම : රුපියල් :..............................

ම විසින් මෙහි මීට ඉහතින් සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

අත්සන : ..............................

දිනය :..............................

නම : ..............................

තනතුර : ..............................

සැලකිය යුතුයි :

බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන සෑම අයැදුම්පත්‍රයක් සමග ම පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

1. ආයතනයේ හෝ සංවිධානයේ ලියාපදිංචි සහතිකය හා එහි සහතික කළ ඡායාස්ථිත පිටපතක්.
2. තෑගි තරගයේ නීතිරීති / කොන්දේසි සහ තෑගි කරනු ලබන තෑගිවල සම්පූර්ණ වටිනාකම හා විස්තර දැක්වෙන අනුමත ලේඛනය සහ එහි සහතික කළ පිටපතක්.
3. නියමිත බලපත්‍ර ගාස්තුව මුදලින් ගෙවූ කුවිතාන්සි පත්‍රය.

(අයදුම්පත්‍රය බස්නාහිර පළාතේ පළාත් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.)

(ආ) ආකෘතිය

බස්නාහිර පළාතේ පළාත් සභාව
පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

**2006 අංක 02 දරන බස්නාහිර පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 98(2) වැනි වගන්තියේ විධිවිධාන අනුව තෑගි තරග සඳහා වූ බලපත්‍රයයි**

බලපත්‍ර අංකය : ....................................................................................

නිකුත් කළ දිනය : ....................................................................................

1. තෑගි තරගයේ නම : ....................................................................................
2. තෑගි තරගය පවත්වන තැනැත්තාගේ / ආයතනයේ / සංවිධානයේ නම : ....................................................................................
....................................................................................
3. ලිපිනය : ....................................................................................
....................................................................................
4. ඇතුළත්වීමේ අවසාන දිනය : ....................................................................................
5. තෑගි තරගය පවත්වන දිනය : ....................................................................................
6. තෑගි තරගය පවත්වන ස්ථානය හෝ පරිශ්‍රය : ....................................................................................
....................................................................................
7. ආයතනයේ හෝ සංවිධානයේ ලියාපදිංචි අංකය හා දිනය : ....................................................................................
....................................................................................
8. පිරිනමන තෑගිවල සම්පූර්ණ වටිනාකම : - රුපියල් : ....................................................................................

* මෙම බලපත්‍රය නිකුත් කර ඇති තෑගි තරගය සඳහා පමණක් වලංගු වේ.

* බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විට ඉදිරිපත් කළ යුතුය.

දිනය : ....................................

....................................................................................
පළාත් ආදායම් කොමසාරිස්,
බස්නාහිර පළාත.

(ඇ) ආකෘතිය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ආදායම් දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව**

**1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ**
**අංක 98(3) වගන්තිය යටතේ නිවේදනය**
**තෑගි තරඟ බද්ධ - වාර්තාව**

යොමු අංකය : ..............................

බලපත්‍ර අංකය : ................................

නිකුත් කළ දිනය : ..............................

මෙම වාර්තාව විධිමත් ලෙස සම්පූර්ණ කර තෑගි තරගය ප්‍රසිද්ධ කිරීමට දින 14 ට පෙර ලබා ගත යුතු බලපත්‍රය ලබාගැනීම සඳහා අදාළ අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

පනවනු ලබන තෑගි තරග බද්ද තරගයට ඇතුල්වීමේ අවසාන දිනය හෝ තරගය පවත්වන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනට දින 14 කට පෙර පළාත් ආදායම් කොමසාරිස්ට මුදලින් හෝ බැංකු අණකරයක් මගින් ගෙවිය යුතුය.

දිනය : ......................................

..............................................................
පළාත් ආදායම් කොමසාරිස්,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : ...............................

1. තෑගි තරගයේ නම : ......................................................................................
2. ආයතනයේ හෝ සංවිධානයේ හෝ තැනැත්තාගේ නම : ......................................................................................
3. තෑගි තරගය පවත්වන ස්ථානයේ ලිපිනය : ......................................................................................
4. තෑගි තරගයට ඇතුල්වීමේ අවසාන දිනය : ......................................................................................
5. තෑගි තරගය පවත්වන දිනය : ......................................................................................
   (මෙම දිනය වෙනස් වන්නේ නම් පළාත් ආදායම් කොමසාරිස්වරයාට ලිඛිතව දැන්විය යුතුය.)
6. පිරිනමන සමස්ථ තෑගිවල එකතු වටිනාකම : රු. ..........................................................................

(පිරිනමන සමස්ථ තෑගිවල එකතු වටිනාකම රුපියල් එක් ලක්ෂයට අඩු වන්නේ නම් තෑගි තරග බද්දෙන් නිදහස් වේ.)

| සමස්ථ තෑගිවල එකතු වටිනාකම | බදු අනු ප්‍රමාණය | බද්ද |
|---|---|---|
| .................................... | 3 % | .................................... |
| .................................... | 5 % | .................................... |

(පිරිනමන තෑගිවල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 25 හෝ ඊට අඩු නම් අනු ප්‍රමාණය 3 % කි. පිරිනමන තෑගිවල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 25 ට වැඩි නම් අනු ප්‍රමාණය 5 % කි.)

ඉහත දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර, නියමිත දිනට පෙර අදාළ බද්ද ගෙවීමට එකඟ වෙමි.)

ප්‍රධාන සංවිධායකගේ අත්සන : ..................................................................

ප්‍රධාන සංවිධායකගේ නම : ..................................................................

පදිංචි ලිපිනය : ..................................................................

..................................................................

දුරකථන අංකය : ..................................................................

දිනය : ..................................................................

04 - 468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.